සැ. යු.- 2015.07.10 දින පළවූ අංක 1923 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,924 - 2015 ජූලි මස 17 වැනි සිකුරාදා - 2015.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
| --- | --- |
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1020 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1021 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
| --- | --- |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු.- සේවක අයවැය සහන දීමනා පනත් කෙටුම්පත, 2015 මැයි මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය** පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 07 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1019 - B 80966— 5,352 (2015/07)
F 1 –

# තනතුරු ඇබෑර්තු

## බදුල්ල මහ නගර සභාව

### ඌව පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

බදුල්ල මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති බදුල්ල නගර සීමා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| ආරක්ෂක නිලධාරී II | 03 | රා.ප.ච. 6/2006 (iv)<br>PL1-2006 A<br>රු.11,730-10x120- 10x130 - 10x145 - 12x160- රු.17,600 | *අභ්‍යන්තර අයදුම්කරුවන්*<br>අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම.<br>*බාහිර අයදුම්කරුවන්*<br>අ.පො.ස(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල,ගණිතය විෂයයන් ද ඇතුලුව විෂයයන් 06කින් සමත්විය යුතුය. |

*සේවා කොන්දේසි :-*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
(2) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
(3) තෝරාගනු ලබන සේවක/සේවිකාවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
(4) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලටද ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඌව පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ බදුල්ල නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.
(5) පත්වීම ලැබීමෙන් පසු අවුරුදු තුනක කාලයකදී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සළකා බැලේ.

*වයස් සීමාව :-* වයස අවුරුදු 18ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතු ය. දැනටමත් රජයේ පළාත් රාජ්‍ය සේවයේ සේවකයින් සම්බන්ධයෙන් වයස් සීමාව බල නොපැවැත්වෙනු ඇත.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස්කර 2015.07.30 වැනි දිනට පෙර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ද, අසම්පූර්ණ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය බදුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

ඩබ්. රත්දෙණිය,
නාගරික කොමසාරිස්,
බදුල්ල මහ නගර සභාව.

2015 ජූනි මස 17 වැනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**බදුල්ල මහ නගර සභාව**

***ආදර්ශ අයදුම්පත්‍රය***

***ආරක්ෂක නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. තැපැල් ලිපිනය :————.

03. උපන් දිනය : වර්ෂය :————, මාසය :————, දිනය :————.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු :————, මාස :————, දින :————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ජාතිය :————.

07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද? යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් :————.

09. වෘත්තීය සුදුසුකම් :————.

10. ඔබ දැනටමත් මහ නගර සභාවේ සේවය කරන්නේ නම් :

    (i) දැනට දරන තනතුර :————.

    (ii) එම තනතුරට පත්වූ දිනය :————.

    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද? ) :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය ඒවා හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07-600

---

# පළාත් පාලන නිවේදන

**තවලම ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 වන වගන්ති වලින් ප්‍රාදේශීය සභා වලට පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 520/7-1988 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 01-42 දක්වා වූ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන උපවගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව තවලම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගැනීම සුදුසු බවත් එහි 21 වැනි අතුරු ව්‍යවස්ථාව මගින් සාද ඇති

අප්‍රසන්න හා අන්තරාදයක වෙළඳාම්වලට අදල උපලේඛනයට පහත උපලේඛන අංක 01 සඳහන් ව්‍යාපාර ඇතුළත් විය යුතු බවත් තවලම ප්‍රාදේශීය සභාව විසින් 2014.10.29 දින ප්‍රාදේශීය සභා රැස්වීමේ යෝජනා අංක 10.08 යටතේ යෝජනා කර සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 25 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛන අංක 01**

*අප්‍රසන්න ව්‍යාපාර*

01. යෝගට් නිෂ්පාදනය
02. කුකුළු ගොවිපල
03. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
04. රසකැවිලි නිෂ්පාදනය
05. වාහන සර්විස් කිරීම
06. එළවළු පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
07. අවමංගල සේවා සපයන ස්ථාන
08. හුණු හා ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම
09. ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
10. බලවේග පෙහෙකම්හලක් පවත්වාගෙන යාම
11. උක් මෝලක් පවත්වාගෙන යාම
12. කොහු මෝලක් පවත්වාගෙන යාම
13. සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම
14. තේ කොළ, කුළුබඩු පැකට් කර විකිණීම
15. වී මෝල්
16. ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17. යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20. දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම
21. දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
22. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
23. මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
26. කිරි ආහාර නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම

*අන්තරායදයක ව්‍යාපාර*

01. ගල් වලක් පවත්වාගෙන යාම
02. යන්ත්‍රානුසාරයෙන් කැටගල් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
05. ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා විකිණීම
06. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
07. පරණ ලෝහ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
08. ෆයිබර් ග්ලාස් නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
09. ඉලෙක්ට්‍රික් වැඩපලක් පවත්වාගෙන යාම
10. කෘෂි ආම්පන්න නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
11. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම

*අප්‍රසන්න හා අන්තරායදයක ව්‍යාපාර*

01. ගරාජ්
02. ලී මෝලක්
03. පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම
05. වායු සමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කිරීම
06. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
07. වඩුමඩුවක් පවත්වාගෙන යාම
08. සිප්පි ඇඹරුම්හලක් හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
09. කම්හලක් පවත්වාගෙන යාම
10. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

07-599

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2015.05.14 දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීයසභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම්, කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත්, ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9-3 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. සී. විජේසිංහ,
ලේකම්,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2015 ජුනි මස 16 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මාර්ග විස්තරය**

| *දිග* | *පළල* |
|---|---|
| අඩි 180 | අඩි 12 |

*මාර්ගයේ නම* - පරණවත්ත මාර්ගය
*වසම* - බෙලිගොඩපිටිය
*ආරම්භය* - බෙලිගොඩපිටිය ප්‍රධාන පාර
*අවසානය* - පරණවත්ත

බෙලිගොඩපිටිය ප්‍රධාන මාර්ගයෙන් ආරම්භව වම් පසින් ඩබ්ලිව්. ඒ. ඩී. රාජපක්ෂ යන අයට අයත් පරණවත්ත, එල්. එම්. එස්. ලියනගේ යන අයට අයත් පරණවත්ත යන ඉඩම්වලින් ද,

දකුණු පසින් ඩබ්ලිව්. ඒ. ඩී, රාජපක්ෂ යන අයට අයත් පරණවත්ත, එල්. එම්. එස්. ලියනගේ යන අයට අයත් පරණවත්ත, යන ඉඩම්වලින් ද මායිම් වන්නාවූ පරණවත්ත දක්වා වූ මාර්ගය.

07-607/2

---

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2015.03.24 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම්, කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් , ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9-3 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. සී. විජේසිංහ,
ලේකම්,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2015 ජුනි මස 16 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාර්ග විස්තරය

| *දිග* | *පළල* |
|---|---|
| අඩි 300 | අඩි 08 |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | - | ගල්ලැනමුල්ල මාර්ගය |
| *වසම* | - | හල්පිටිය |
| *ආරම්භය* | - | හල්පිටිය හපුගොඩ මාර්ගයේ ගලහිටියාව කුඹුර අසලින් |
| *අවසානය* | - | ගලහිටියාවවත්ත ඉඩම |

හල්පිටිය හපුගොඩ මාර්ගයේ ගලහිටියාව කුඹුර අසලින් ආරම්භව වම් පසින් ඒ. සුමනාවතී කුමාරිහාමි සහ ආර්. එම්. අනුලාවතී යන අයට අයත් ගලහිටියාව කුඹුර, ඒ. සුමනාවතී කුමාරිහාමි යන අයට අයත් ගලහිටියාව කුඹුර, පී. කේ. මදුරාවති මැණිකේ යන අයට අයත් ගලහිටියාවවත්ත හෙවත් මුගුණුගහපිල්ලෑව, ඩී. ආර්. ලසන්ත කෝසල බංඩාර මුණසිංහ යන අයට අයත් මුගුණුගහමුල පිල්ලෑව හෙවත් ගලහිටියාව යන ඉඩම්වලින් ද,

දකුණු පසින් ඇළ මාර්ගයකින් ද, පී. කේ. මදුරාවති මැණිකේ යන අයට අයත් ගලහිටියාවවත්ත හෙවත් මුගුණුගහපිල්ලෑව, ඩී. ආර්. ලසන්ත කෝසල බංඩාර මුණසිංහ යන අයට අයත් මුගුණුගහමුල පිල්ලෑව හෙවත් ගලහිටියාව යන ඉඩම්වලින් ද මායිම් වන්නාවූ ගල්ලැනමුල්ල මාර්ගය.

මාර්ග විස්තරය

| *දිග* | *පළල* |
|---|---|
| අඩි 2110 | අඩි 14-16 |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | - | බෝගහතැන්න පස්වන පටුමග |
| *වසම* | - | තල්දෑව |
| *ආරම්භය* | - | තල්දෑව බෝගහතැන්න |
| *අවසානය* | - | බෝගහතැන්න |

තල්දෑව බෝගහතැන්නෙන් ආරම්භව වම් පසින් ඩබ්ලිව්. ජී. එම්. පේමවති, ඩබ්ලිව් එම්. ගුණසේන, ටී. ජී. අනෝමා පුෂ්පමාලී රණසිංහ, එල්. පී. කරුණාතිස්ස, කේ. ජී, දයාවති, පී. කේ. ඩී. සෝමාවති මැණිකේ, ඒ. ඒ. උපුල් පෙරේරා, ටී. ජී. නයනා දීපානි රණසිංහ, ආර්. සරත් විජයානන්ද යන අයට අයත් බෝගහතැන්න ඉඩම හෝ ඉඩම්වලින් ද,

දකුණු පසින් කේ. පී. එන්. සමරතුංග, වයි. එම්. ජයරත්න මැණිකේ, ඩී. ඒ. මංජුලා සංජීවනී, ජේ. කේ. ප්‍රියන්ත ගුණරත්න, යන අයට අයත් බෝගහතැන්න ඉඩම හෝ ඉඩම්වලින් ද මායිම් වන්නාවූ බෝගහතැන්න පස්වෙනි පටුමග මාර්ගය.

මාර්ග විස්තරය

| *දිග* | *පළල* |
|---|---|
| අඩි 475 | අඩි 08 |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | - | කිරිවාන සිට හල්ගහමුලහේන දක්වා මාර්ගය |
| *වසම* | - | නාරම්බැද්ද නැගෙනහිර |
| *ආරම්භය* | - | බෝගහමුලවත්ත |
| *අවසානය* | - | හල්ගහමුලහේන |

නාරම්බැද්ද පන්සල පාරේ පාලම අසල බෝගහමුලවත්ත අසලින් ආරම්භව වම්පසින් ටී. ඩබ්ලිව්. ජිනදාස, ඩබ්ලිව්. ඩී. ජයසිංහ, සෝමසිරි ගුණතිලක, ඩබ්ලිව්. ඩී. එස්. විජේසිංහ යන අයට අයත් අමුණේ කුඹුර, ඩබ්ලිව්. ඩී. සුමනාවතී යන අයට අයත් ඊරියගහමුල කුඹුර, ඩබ්ලිව්. ඩී. එස්. ජයරත්න යන අයට අයත් ඊරියගහමුල කුඹුර, ආර්. ජයසේන යන අයට අයත් ඊරියගහමුල කුඹුර, ඩබ්ලිව්. විමලසේන යන අයට අයත් තලගොල්ලේ බෝගහමුලහේන යන ඉඩම්වලින් ද,

දකුණු පසින් ආර්. ජයසේන යන අයට අයත් තලගොල්ලේ බෝගහමුලහේන, ඩබ්ලිව්. විමලසේන යන අයට අයත් තලගොල්ලේ බෝගහමුලහේන යන ඉඩම් වලින් ද මායිම්වන්නාවූ හල්ගහමුලහේන දක්වා වූ මාර්ගය.

07-607/1

## අරණායක ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/ මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. චන්ද්‍රාවතී,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2015 ජූනි මස 30 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | :- | තල්ගමුව ප්‍රධාන පාරේ සිට සමුපකාරය අසළින් කුඩා ඔය දක්වා මාර්ගය |
| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | :- | තල්ගමුව අට්ටාපිටිය ප්‍රධාන මාර්ගය |
| *මාර්ගයේ අවසානය* | :- | කුඩා ඔය |
| *මාර්ගයේ දිග සහ පළල* | :- | පළල 8' දිග 300 m |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | *නම* | *ඉඩමේ විස්තර* |
|---|---|---|
| 01. | විහාරාධිපති යාගොඩ රත්නසාර හිමි | තල්ගමුව කරහා පිටිගොඩ මුංකොටුව ඉඩම |
| 02. | විහාරාධිපති යාගොඩ රත්නසාර හිමි | තල්ගමුව කරහා පිටිගොඩ මුංකොටුව ඉඩම |
| 03. | ඩබ්ලිව්. එම්. රණවීර | උඩමුල්ල වත්ත |
| 04. | ඩබ්ලිව්. එම්. වීරසූරිය | උඩමුල්ලවත්ත |
| 05. | ඒ. එම්. මිලාන් තුෂාර චන්ද්‍රතිස්ස | බෝගහවත්ත |
| 06. | ජී. එම්. ඩබ්ලිව්. පෙරේරා | වැලිමන්න වත්ත |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | *නම* | *ඉඩමේ විස්තර* |
|---|---|---|
| 01. | ඩබ්ලිව්. එම්. කේ. වීරසූරිය | මුංකොටුව ඉඩම |
| 02. | ඩබ්ලිව්. එම්. කේ. වීරසූරිය | මුංකොටුව ඉඩම |
| 03. | ඩබ්ලිව්. එම්. කේ. වීරසූරිය | මුංකොටුව ඉඩම |
| 04. | ඩබ්ලිව්. එම්. කේ. වීරසූරිය | මුංකොටුව ඉඩම |
| 05. | ඩබ්ලිව්. එම්. ඩී. ජේ. වීරසූරිය | අමුගහවත්ත |
| 06. | කේ. එම්. බී. වර්ණකුලසූරිය | කහට ගහ වත්ත |
| 07. | ඩබ්ලිව්. එම්. රණරාජා | උඩුමුල්ල වත්ත |
| 08. | කේ. එම්. කේ. රත්නසූරිය | උඩුමුල්ල වත්ත |

| | | |
|---|---|---|
| *මාර්ගයේ නම* | :- | ගම්මාන්නාගොඩ රත්මල්දෙණිය මාර්ගය |
| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | :- | මහගොඩ තැන්න සිට රත්මල්දෙණිය මාර්ගය |
| *ග්‍රාමසේවා වසම හා අංකය* | - | ගම්මාන්නාගොඩ 17D |
| *මාර්ගයේ දිග සහ පළල* | :- | පළල 8' දිග 300 m |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | නම | ඉඩමේ විස්තර |
|---|---|---|
| 01. | ඒ. ආර්. ජයසේකර | පන්සල වත්ත ඉඩම |
| 02. | ඊ. ආර්. ජිනදස | රත්මල්දෙණිය ඉඩම |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | නම | ඉඩමේ විස්තර |
|---|---|---|
| 01. | ඒ. ආර්. ජයසේකර | පන්සල වත්ත ඉඩම |
| 02. | ඊ. ආර්. ජිනදස | රත්මල්දෙණිය ඉඩම |

07-769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.